## 23. රජරට ශිෂ්ටාචාරයේ පරිහානියට වාරි කර්මාන්තයේ බලපෑමක් සිදුවීද...?

කේ.පී.එච් රන්දික

### හැඳින්වීම

ශ්‍රී ලංකාව අතීතයේ සිට රාජාණ්ඩු ක්‍රමයක් ඔස්සේ පාලනය වූ රටකි. මුලම පාලන මධ්‍යස්ථානය වූයේ අනුරාධපුර නගරයයි. අනුරාධපුර රාජධානිය බිඳවැටීමෙන් අනතුරුව ප්‍රධාන පාලන මධ්‍යස්ථානය ලෙස නැගී සිටියේ පොළොන්නරු රාජධානිය ය. අනුරාධපුර හා පොළොන්නරු රාජධානි පැවති සමයේ රජරට මුල් කොට සුවිශේෂී ශිෂ්ටාචාරයක් සභ්‍යත්වයක් ජනනය වූ බැවින් එම සමය රජරට ශිෂ්ටාචාරය ලෙස හැඳින්වේ. සමකාලීන ලොව අන් රටවලට නොදෙවෙනි අයුරින් දියුණු සංස්කෘතියක්, තාක්ෂණයක් තුළින් පොහොසත් වූ ලාංකිකයා රජරට ශිෂ්ටාචාර සමයේ මෙරට ස්වර්ණමය වූ කාල පරිච්ඡේදයක් නිර්මාණය කරවීමෙහි ලා සමත් විය. දියුණු දේශපාලන, සමාජ, සංස්කෘතික මෙන්ම ආර්ථික පසුබිමක් තිබූ මෙම රජරට ශිෂ්ටාචාරය අවස්ථා දෙකක දී විවිධ හේතූන් මත පරිහානියට ලක් වන්නට විය. අනුරාධපුර රාජධානිය බිඳ වැටීමෙන් පසු ලංකා රාජ්‍ය පොළොන්නරුවට විතැන් වූ අතර පොළොන්නරු රාජධානිය බිඳ වැටීමෙන් පසු රජරට ශිෂ්ටාචාරයේ අවසානය සනිටුහන් විය. මේ ආකාරයෙන් රජරට ශිෂ්ටාචාරය බිඳ වැටීමට විවිධ අවස්ථා වල හේතු සාධක ගණනාවක් ම බලපෑ අතර ශිෂ්ටාචාරයේ පරිහානියට ආර්ථික වශයෙන් එන වාරි කර්මාන්ත වල බිඳ වැටීම හේතු සාධකයක් වුනිද යන්න පිළිබඳව මෙමගින් සාකච්ඡාවට බඳුන් කොට ඇත.

### ක්‍රමවේදය

මෙම ලිපිය සඳහා තොරතුරු සම්පාදනය කරගැනීම ද්විතීයික දත්ත සම්පාදන ක්‍රමවේදයන් වන සාහිත්‍යය මූලාශ්‍රගත තොරතුරු උපයුක්ත කොටගන්නා ලදී. මේ ආශ්‍රයෙන් දත්ත එක් රැස් කර ගැනීමෙන් මෙම අධ්‍යයන වාර්තාව සිදු කිරීම මඟින් රජරට ශිෂ්ටාචාර අවධිය පරිහානියට පත් වන්නට සෘජුවම හෝ වක්‍රවම හෝ බලපෑම් කළ වාරි කර්මාන්තයේ බලපෑම පිළිබඳව විමර්ෂණාත්මක අධ්‍යයනක් සිදු කිරීමට බලාපොරොත්තු වෙමි.

### විමර්ශනය

පුරාණ ශ්‍රී ලංකාවේ ආර්ථික ප්‍රතිපත්තියේ ඉතා වැදගත් තැනක් ජල සම්පත් පාලනය වෙත යොමු වී තිබිණ. ඒ මන්ද යත් පූර්ව ඓතිහාසික අවදියේ ජනගහනය ක්‍රමයෙන් වර්ධනය වීමත් සමඟ ඇති වූ ආහාර අවශ්‍යතාවයට පිළියම් යෙදීම වෙනුවෙන් වගා බිම් ප්‍රමාණය ව්‍යාප්ත කිරීමට ඔවුනට සිදු විය. එහි දී වියළි කලාපයේ පැවති වියළි දේශගුණික තත්වය ඔවුන්ට මහත් අභියෝගයක් වූ අතර එයට විකල්ප විසඳුම් සොයා යෑමට ඔවුන්ට සිදු විය. පූර්ව ඓතිහාසික අවදියේ මුල් කාලයේ දී වියළි කලාපීය ජනයා සිය ජල අවශ්‍යතා සපුරාගෙන ඇත්තේ ස්වාභාවිකව නිර්මාණය වූ රැළි භූමි හේතුවෙන් හැඩගැසී තිබූ 'පතස්/පතහ' නම්වන වර්ෂා ජලය ඒකරාශී වූ කුඩා පොකුණු හරහා බව විද්වත් මතය වී ඇත. ඉන්පසු අවදියේ දී මූලාශ්‍රයමය ගත තොරතුරු මත පෙනී යන්නේ ජනයා සිය කෘෂිකාර්මික අවශ්‍යතා වෙනුවෙන් වැව් නිර්මාණය වෙත යොමු වූ බවයි. ඒ පිළිබඳව තොරතුරු වංශකතාවන්හි නොදැක්වුණත් ශිලා ලේඛන ආශ්‍රිතව යම් තොරතුරු ප්‍රමාණයක් අණාවරණය කර ගැනීමට ඉඩකඩ සැලසෙනු ඇත.

ක්‍රමයෙන් සිදු වූ ජනගහන වර්ධනයත් සමඟ ඇති වූ ආහාර අවශ්‍යතාවය සපුරා ගැනීම වෙනුවෙන් රාජ්‍ය අනුග්‍රහය යටතේ තරමක් විශාල වැව් නිර්මාණය වී ඇති අතර මුල්කාලීන රජවරුන් ඒ අයුරින් ඊට අනුග්‍රහය දැක්විය. ක්‍රමිකව සිදුවූ ජනගහණ ප්‍රසාරණය සමඟ ඇති වූ ආහාර අවශ්‍යතාවයන්ට පිළියම් සෙවීම වෙනුවෙන් ක්‍රි. පූ. 1 වන සියවසේ සිට මහා වැව් ඉදිවන්නට පටන් ගැනුණු බව ලිඛිතමය සාධක ඇසුරින් නිගමනය කළ හැකිය. පොළොන්නරු අවදියේ මහා පැරකුම් රාජ්‍ය සමයේ සිට ශ්‍රී ලාංකිකයෝ සමුදුරු පරයන වැව් තැනීමට යොමු වූයේ දියුණු තාක්ෂණික ක්‍රමවේදයන් ද සමඟයි. කෙසේ හෝ රජරට ප්‍රදේශයේහි සෑම ගමකටම පාහේ වැවක් තිබුණු බවට සාධක දනුදු හඳුනාගත හැකිය. අතීත ලාංකික ආර්ථිකය මුළුමනින්ම පාහේ කෘෂිකාර්මික පදනමකට යටත්ව තිබුණෙන් ආර්ථික ස්ථාවරත්වය සඳහා සැළසුම් සහගත ලෙස ජල පරිභෝජනය අත්‍යාවශ්‍ය කරුණක් විය.

ශ්‍රී ලංකාවේ වියළි කලාපය මුල් කරගනිමින් බිහි වූ නාගරීකරණයේ ඵලයන් වූයේ අනුරාධපුරය හා පොළොන්නරුවයි. පණ්ඩුකාභය රාජ්‍ය සමයේ සිට පස්වන මිහිඳු රජු දක්වා ශතවර්ශ දාහතරක් පමණ පැවති ලංකාවේ පළමුවෙනි රාජධානි සමය වූ අනුරාධපුර රාජධානි සමය තුළ රජරට ශිෂ්ටාචාරයේ ආරම්භය සනිටුහන් විය. රජරට ශිෂ්ටාචාරයේ දෙවන උපත ලෙස අනුරාධපුර රාජධානිය බිඳ වැටීමෙන් පසුව පොළොන්නරුව පාලන මධ්‍යස්ථානය ලෙස ගොඩ නැඟීම පෙන්වා දිය හැක. එය ශත වර්ෂ දෙකකට සීමා විය. අනුරාධපුර යුගය අරඹමින් පණ්ඩුකාභය රජුගේ සිට පොළොන්නරු යුගයේ පැරකුම්බා ආදි පාලකයන් සිදු කල සුවිසල් වාරි නිර්මාණ රජරට ශිෂ්ටාචාර අවධිය තුළ වාරි තාක්ෂණය දීර්ඝ කාලයක කාල යාත්‍රාවක් දියත් කිරීය. කෘෂිකාර්මිකව ලත් සමෘද්ධිය කොතෙක් ද යත් දේශීය අවශ්‍යතා පූර්ණයෙන් අනතුරුව අතිරික්තය අපනයනයට පවා යොමු වූ ආර්ථික හැකියාවක් මෙරට සතුවිය. එය ක්‍රි.ව 7 වන සියවසෙන් පසු අභාවයට ගිය අතර මේ සමය වන විට ලක්දිව සතර වරක් විදේශීය ආක්‍රමණ වලට ගොදුරු විය. ඒවායේ බලපෑම තුලින් මෙම යුග වල පරිහානිය සිදු විය. රජරට ශිෂ්ටාචාරයේ පරිහානිය පිළිබඳ විමසීමේ දී අනුරාධපුර මෙන්ම පොළොන්නරු යුග ද්විත්වයේම සිදු වූ සංසිද්ධීන් බලපාන්නට වූ බව අධ්‍යයනයේ දී පෙනී යයි. ඒ අනුව මෙහිදී රජරට ශිෂ්ටාචාරයේ පරිහානියට වාරි මාර්ග වල බලපෑමක් සිදු වුනාද යන්න පිළිබඳව කරුණු දැක්වීමේ දී මෙම රාජධානි දිවිත්වයේම පරිහානිය සිදු වන අවස්ථාවන් වල දී ආර්ථිකමය වශයෙන් වාරි මාර්ග වල බිඳ වැටීමෙන් සිදු වූ බලපෑම පිළිබඳව වෙන් වෙන් වශයෙන් සාකච්ඡා කර ඇත.

අනුරාධපුරය සියවස් 15ක් පමණ කාලයක් තුළ ලංකාවේ පාලන මධ්‍යස්ථානය විය. මෙහි ආරම්භක පාලකයා පණ්ඩුකාභය රජු ලෙස සැලකෙන අතර අවසන් පාලකයා වූයේ පස්වන මිහිඳු රජු ය. මෙම රාජධානියේ පරිහානියට හා බිඳවැටීමට බලපෑ හේතු සාධක ගණනාවක් ඇති බව මූලාශ්‍රය පරිශීලනයෙන් හෙළි වේ. අනුරාධපුර රාජධානිය පරිහානියට සහ බිඳ වැටීමට බල පෑ ප්‍රධානතම හේතු සාධකය ලෙස රාජධානියේ අවසන් ශතවර්ෂයේ ඇති වූ දකුණු ඉන්දීය ආක්‍රමණ සැලකිය හැකි ය. නමුත් ආර්ථිකමය වශයෙන් ගත් කළ වාරි මාර්ග වල අඩපණ වීම අනුරපුර යුගයේ දී රාජධානියේ පරිහානියට හේතු වන්නට වූ බව මූලාශ්‍ර ගත තොරතුරු ආශ්‍රයෙන් පැහැදිලි වේ. ඕනෑම රාජ්‍යයක ශක්තිමත් බව රඳා පවතින්නේ ආර්ථිකමය ශක්තිමත් භාවය මතය. සාමාන්‍ය ජනතාව පාලකයාගෙන් බලාපොරොත්තු වූයේ වාරි කර්මාන්ත ඉදි කරමින් පවතින වාරි කර්මාන්ත නඩත්තු කරමින් ආර්ථිකයට අනුග්‍රහයක් දැක්වීමයි. මහාවංසයේ දැක්වෙන පරිදි රජරට ආශ්‍රිතව ඉදි වූ මුල්ම වැව අනුරාධ නම් ප්‍රධානියකු විසින් අනුරාධපුර දකුණු දිශාවේ කරවන ලද්දකි. ක්‍රිස්තු පූර්ව 4 වන සියවසේ පණ්ඩුකාභය රජු විසින් අභය වැව හෙවත් බසවක්කුලම වැව කරවන ලද බවට ඉතිහාසයේ සඳහන් වෙයි. එමෙන්ම දේවානම්පියතිස්ස රජු විසින් තිසා වැව ඉදි කරවීමෙන් තරමක් විශාල වැව් රාශියක් ක්‍රි.පූ. 1වන සියවස අවසානය දක්වා ඉදිවන්නට වූ බවට සාධක හදුනාගත

හැකිය. එමෙන්ම ඒ වන විට වියළි කලාපයේ සෑම ගමකම පාහේ ගම් වැව් ව්‍යාප්තව පැවති බවට සාධක හඳුනා ගැනීමට හැකියාවක් තිබේ. මෙසේ ගම් වැව් වලින් එහි පහළ තෙත් බිම් සරු කරද්දී එක ගමකට එක් වැවක් ලෙස ආරම්භ වූ වාරිමාර්ග ක්‍රමය ක්‍රමිකව ශතවර්ෂ තුනක් පමණ තාක්ෂණිකව ලත් විකාශනය තුළින් රජරට මූලික කොට ක්‍රිස්තු වර්ෂ පළමු වන සියවස වනවිට විශාල වැව් ඉදිකිරීම ද ඇරඹිය. වසභ, මහසෙන් හා ධාතුසේන වැනි පාලකයින් වැව්, ඇළ මාර්ග හා අමුණු ඉදි කරමින් රාජ්‍ය අනුග්‍රහය ලබා දුන් අතර අවසන් වරට අනුරාධපුර රාජධානියෙහි වාරි කර්මාන්තයක් ඉදි කළ බවට තොරතුරු දක්නට ඇත්තේ හතරවන මහින්ද රජුගේ කාලයේ දී ය. ඉන් පසු වාරි කර්මාන්ත ඉදි කළ බවට හෝ ප්‍රතිසංස්කරණය කළ බවට සාධක දක්නට නොමැත.

අනුරපුර  අග භාගයේ දී පැමිණි දරුණු චෝල ආක්‍රමණය හේතුවෙන් යුධ ගැටුම් මැද මේ ආකාරයට වාරි මාර්ග පද්ධති විනාශ වෙන්නට ඇතැයි සිතිය හැක.  වාරිමාර්ග පද්ධතිය රජරට ජීවනාලිය බඳු ය. මෙම වාරිමාර්ග පද්ධතිය නොසලකා හැරීම රටේ ආර්ථිකය බිඳ වැටීමට ඉවහල් වූ කරුණකි. මේ ආකාරයෙන් විවිධ ආක්‍රමණිකයන් හේතුවෙන් අනුරාධපුර රාජධානි සමයේ වාරි මාර්ග පද්ධති අඩපණ වන්නට පටන් ගත් අතර ඊට හේතු වන්නට ඇත්තේ ආක්‍රමණික තත්වයක් මත වාරි මාර්ග පද්ධතිවල නඩත්තු කටයුතු ආදිය සිදු කරගෙන යාමට බාධා පැමිණීමයි.

එමෙන් ම අනුරපුර අග භාගයේ දී දුර්වල පාලකයන්ගේ රාජ්‍යත්වය  අනුරපුර රාජධානිය බිඳ වැටීමට හේතු වූවා මෙන්ම මෙම දුර්වල රාජ්‍යත්වය අනුරපුර වාරි මාර්ග පද්ධතියේ බිඳ වැටීමට ද සෘජුවම හේතුවක් විය. අනුරාධපුර යුගයේ අවසන් වැදගත් පාලකයා හතරවන මහින්ද රජු ලෙස සැලකිය හැකිය. මොහුගෙන් පසු බලයට පත් වූ පස්වන සේන හා පස්වන මිහිඳු යන රජවරු දුර්වල පාලකයෝ වූහ. මේ ආකාරයෙන් දුර්වල පාලකයන්ගේ රාජ්‍යත්වය රාජ්‍යයේ සෑම අංශයක්ම අඩපණ කරා සේම වාරි මාර්ග පද්ධති වල බිඳ වැටීමට ද මෙකී දුර්වල රාජ්‍යත්වය බලපාන්නට විය. ඒ ආකාරයෙන්ම වාරි මාර්ග පද්ධති වල නඩත්තුවට මෙන්ම ඒවායේ නව ඉදි කිරීම් වලට අවධානයක් යොමු නොකිරීම හේතුවෙන් රටේ කෘෂි ආර්ථිකය බිඳ වැටී රාජධානියේ පරිහානය වේගවත් වන්නට විය.

අනුරාධපුර සිංහාසනය සඳහා මෞර්ය හා ලම්බකර්ණ වංශ දෙක අතර නිරන්තර අරගල පැවතිණ. එක් පෙළපතකට හෝ දීර්ඝ කාලයක් සිංහාසනය හිමි කර ගෙන කටයුතු කළ නොහැකි විය. එම නිසා දීර්ඝ කාලයක් එක් පෙළපතක් බලයේ රැඳී සිටිමින් තම ප්‍රතිපත්ති ඉදිරියට පවත්වාගෙන යාමට නොහැකි විය. මේ ආකාරයේ වාතාවරණයක් මත රටේ පාලකයා කෙසේ හෝ තම රාජ්‍යත්වය රැක ගැනීමට පමණක් උත්සහ කල අතර රටේ සමාජ, ආර්ථික තත්වයන් පිළිබඳව සොයා බලා කටයුතු කරන්නට අවධානය ලබා නොදෙන්නට විය. ඒ හේතුවෙන් මෙතෙක් කලක් අනුරපුර ශ්‍රේෂ්ඨ පාලයක් විසින් රැකගෙන ආ වාරි මාර්ග පද්ධති ප්‍රතිසංස්කරණයකින් තොරව අකාලයේ බිඳ වැටෙන්නට විය. ජලය ලැබෙන ප්‍රධාන මාර්ග එසේ බිඳ වැටෙන්නට ගත් නිසාවෙන් කෘෂි ආර්ථිකය සම්පූර්ණයෙන්ම බිඳ වැටි ආර්ථික අතින්ද රාජ්‍ය පිරිහෙන්නට විය.

අනුරපුර රාජධානිය බිඳ වැටීමත් සමඟම රජරට ශිෂ්ටාචාරයේ පළමුවන නාගරික මධ්‍යස්ථානය වියැකී යන්නට වූ අතර නැවතත් රාජ්‍ය මධ්‍යස්ථානය අනුරාධපුරයේ ස්ථාපිත කිරීමට සුදුසු පසුබිමක් නොවීම නිසාවෙන් රජරට ශිෂ්ටාචාරයේ දෙවන උපත පොළොන්නරුවෙන් ආරම්භ විය. අනුරාධපුර යුගයේ මෙන්ම ශ්‍රේෂ්ඨ පාලකයන් රැසක් පොළොන්නරු යුගයේ දී පහළ නොවූ අතර මෙම අවධියේ දී රාජ්‍යත්වයට පත් ශ්‍රේෂ්ටතම

නරපතියන් කීහිප දෙනෙක් විය. ඒ අතරින් පළවන විජයබාහු රජු, පළවන පරාක්‍රමබාහු රජු සහා කීර්ති ශ්‍රී නිශ්ශංකමල්ල රජු සුවිශේෂී වේ. මේ අතරින් පළවන විජයබාහු රජු මෙන්ම පළවන පරාක්‍රමබාහු රජු රටේ ඉදිරි පැවැත්ම සඳහා විශාල වශයෙන් සේවාවන් සිදු කළ අතර රටේ පාලකයාගේ ප්‍රධානම වගකීමක් වන ආර්ථිකය ශක්තිමත් කිරීමටද විශාල දායකත්වයක් ලබා දුනි. අනුරපුර රාජ්‍ය අවසාන භාගයේ දී මෙරට වාරි කර්මාන්තයේ බිඳ වැටීමක් සිදු වූ අතර එහි යළි නැගී සිටීමක් සිදු වූයේ පොළොන්නරු අවධියේ දීය. පළවන විජයබාහු රජුගේ රාජ්‍යත්වයෙන් පසු බිඳ වැටී ගිය වාර් මාර්ග රැසක් යළි ප්‍රතිසංස්කරනය කරන්නට විය. ඒ අතර මහකනදරාව, නාච්චදූව, මාළුළිය, ඉනාමලුව, වලාහස්ස, මින්නේරිය, පණ්ඩවාපී ආදී වැව් ප්‍රතිසංස්කරණය කිරීම  සිදු විය. වැව් හා ඇළ මාර්ග ප්‍රතිසංස්කරණය කොට වාරිමාර්ග පද්ධතිය පුනරුත්ථාපනය කිරීමට උත්සාහ දැරීය. එමෙන්ම බුදුගුණ වැව නමින් අභිනවයෙන් වැවක් තැනීම ද සිදු විය.

කෙසේ නමුත් පලවන විජයබාහු රජුගේ ඇවෑමෙන් පසුව පොළොන්නරු රාජධානිය ව්‍යාකුල තත්වයකට පත් විය. පළමුවන විජයබාහු රජතුමා ක්‍රි.ව. 1150/11 කාලයේ දී අභාවප්‍රාප්ත වූ පසු දීර්ඝ කාලයක් මුළුල්ලේ කැරලි ඇති විය. මේ කාලයේ දී ඇති වූ ව්‍යාකුලතාව හේතුවෙන් වාරි මාර්ග පද්ධති වලටද වූ විනාශය පිළිබඳව චූලවංසයේ මේ අයුරින් දක්වා ඇත.

***"මේ කාලය තුළ දී පක්ෂ දෙකේ රජුන්ට යටත් සීමාවල සිටුවන ලද සාමන්තයෝ ඔවුනොවුන් සමග බෙහෙවින් යුධ කරමින් සුසමෘද්ධ නොයෙක් ගම් නියම් ගම් ගිනි තබමින් වතුර පිරුණු වැව් සිඳිමින් සියලු සොරොව් අමුණු හැම අන්දමින්ම වනසමින් පොල් ආදී ප්‍රයෝජනවත් වෘක්ෂයන් සිඳිමින් ඔවුනොවුන්ට සතුරු ව යම් සේ පැරණි ගම් පිහිටි තැනකයි දැන් එකට හැකි නොවේද එසේ රට වැනසූහ"***

අවුරුදු විසි පහක් පමණ කාලයක් මුළුල්ලේ පැවැති ව්‍යාකුල තත්වය මෙයින් පැහැදිළි වේ. මෙසේ රාජ්‍ය පාලනය ලබා ගැනීමට පමණක් අරමුණු කරගෙන රජරට ශිෂ්ටාචාරයේ පදනම වූ වාරිමාර්ග වැනසූ මෙරට අදූරදර්ශී පාලකයන් නිසාවෙන් මෙරට වාරිමාර්ග පද්ධති වලට විශාල වශයෙන් හානියක් සිදු වූ බව පැහැදිලි වේ. මෙම තත්වයද යම් තරමින් හෝ පොළොන්නරුව රාජධානියේ පිරිහීමට බලපෑමක් සිදු වූ බව පෙනේ. මන්ද මෙවැනි රාජ්‍ය ව්‍යාකුල තත්වයන් මත රටේ ආර්ථිකය ද ව්‍යාකුල වූ පසු රාජ්‍යයේ ස්ථාවරත්වය සහමුලින් ම බිඳ වැටීමට ලක්වන බැවිනි.

පළවන විජයබාහු රජුගෙන් පසු විවිධ පාලකයන් රාජ්‍යත්වයට පත් වුව ද ස්ථාවර වීමට නොහැකි විය. විජයබාහු රජුගෙන් පසුව ස්ථාවර රාජ්‍ය පාලනයක් ගෙන ගියේ මහා පරාක්‍රමබාහු රාජ්‍ය සමයේදී ය. දක්ඛිණ දේශයේ උපත ලබමින් ඉතාමත් ව්‍යාකුල තත්වයන් රැසකට මුහුණ දෙමින් හැදී වැඩෙමින් ඉතාමත් සැලසුම් සහගත ලෙස පොළොන්නරුවේ පාලකයා ලෙසට පත් වී මෙරට එක්සත් කිරීමට ද සමත් වූ ශ්‍රේෂ්ට පාලකයෙක් ලෙස පරාක්‍රමබාහු රජු හැඳින්විය හැක. පළවන පරාක්‍රමබාහු රජු මෙරට රාජ්‍යත්වයට පත් වීමෙන් පසු සමාජ, සංස්කෘතික, දේශපාලන, ආර්ථික ආදි සෑම අංගයක්ම දියුණුවට පත් වූ අවධියක් වේ. මෙම රජුගේ අවධියේ දී ආර්ථික තත්වය ද ඉතාමත් ඉහල මට්ටමක පැවතින. දිවයිනේ ආර්ථිකය දියුණු කිරීම සඳහා වාරිමාර්ග කටයුතු රාශියක් මෙතුමා විසින් කරන ලදී. ඒවා අදියර දෙකක් වශයෙන් සිදු වූ බව පැහැදිලි වේ. එනම් දක්ඛිණ දේශයේ පාලකයාව සිටි අවධියේ දී කරන ලද වාරිමාර්ග සහ දිවයිනේ ම පාලකයා වීමෙන් පසු කරන ලද වාරිමාර්ග ලෙසිනි. දක්ඛිණ දේශය සංවර්ධනය කිරීම සඳහා මෙතුමා සිදු කළ වාරිමාර්ග කටයුතු වංසකථාවේ සවිස්තර ලෙස දැක් වේ. එහිදී ''අහසින් වැටෙන එක දිය බිඳකුදු ප්‍රයෝජනයට නොගෙන මුහුදට ගලා යාමට ඉඩ නොදිය යුතු ය'' යන්න පැවසූ එතුමා දැදුරු ඔය හරස්

කර අමුණු බැඳීමට හා කළුතර දිස්ත්‍රික්කයේ පස්දුන් කෝරළේ අස්වද්දා එම ප්‍රදේශය සරුසාර ගොවි බිමක් කිරීමට කටයුතු කළේ ය. දැදුරු ඔයේ ජලයෙන් ප්‍රයෝජන ගැනීම උදෙසා එතුමා එහි ස්ථාන තුනක අමුණු බඳවා ජලප්‍රවාහන ව්‍යාපාර තුනක් ආරම්භ කළේ ය. ඒවා, කොට්ඨබද්ද, සූකරනිජ්ජර, දෝරදත්තික යනුවෙන් වංසකථාවේ සඳහන් වේ. මෙතුමාගේ වාරිමාර්ග කටයුතු අතර වැදගත් ම කාර්යය ලෙස දැක්විය හැක්කේ පොළොන්නරුවේ පරාක්‍රම සමුද්‍රය ඉදි කිරීම යි. එය දෙවන අදියරේ දී කරන ලද්දකි. ලංකාවේ විශාලතම වැව් අතරින් එකක් වන මෙම ජලාශය ඉදි කර ඇත්තේ තෝපා, දුම්බුටුලු හා එරමුදු යන වැව් එක් කිරීමෙනි. මෙයට ජලය ලබා ගෙන ඇත්තේ අඹන් ගඟේ අංගමැඩිල්ල නම් ස්ථානයක අමුණක් බැඳීමෙනි. අමුණෙහි ජලය අංගමැඩිල්ල ඇළ දිගේ වැවට ගලා යාමට සලස්වා ඇත. තිස්තුන් වසරක රාජ්‍ය කාලය තුළ එතුමා විසින් අමුණු 165ක් ද ඇළවල් 3910ක් ද මහවැව් 163ක් ද කුඩා වැව් 2376ක් ද කරවන ලද බව වංසකථාවේ සඳහන් වේ. ප්‍රතිසංස්කරණය කරන ලද වැව් අතර, මින්නේරිය වැව, කලා වැව, නාච්චදූව වැව, ගිරිතලේ වැව, මහකනදරා වැව, යෝධ වැව, මහගල්කඩවල වැව, පදවිය වැව, අංගමු වැව, කවුඩුලු වැව, කණ්ඩලම වැව, උරුවෙල වැව, පාඬික්කුලම් වැව ආදිය සඳහන් කළ හැකි ය.

මේ ආකාරයෙන් පරාක්‍රමබාහු රජු ලාංකේය වාරි මාර්ග පද්ධතිය නඟා සිටුවමින් රටේ ආර්ථිකය ඉහළ නැංවීමට ඉතාමත් මෙහෙයක් කළ බව මූලාශ්‍රගත තොරතුරු අනුව සනාථ කරගත හැක. නමුත් පරාක්‍රමබාහු රජුගෙන් පසු යළිත් රාජ්‍ය අස්ථාවර වීමට පටන් ගත් අතර ඉන්පසු රාජ්‍යත්වයට පත් වූ විවිධ පාලකයන් මඟින් මේ අයුරින් වාරි මාර්ග ක්ෂේත්‍රයට මෙහෙවරක් වූ බවට සාධක හමු නොවේ. පසුව පොළොන්නරුවේ රාජ්‍යත්වයට පත් කීර්ති ශ්‍රී නිශ්ශංකමල්ල අවධිය පොළොන්නරු යුගයේ අනෙක් වැදගත් සමය විය. නමුත් මෙම රජු විසින් වාරි මාර්ග පද්ධති කිසිවක් කළ බවට සත්‍ය ලෙස සාධක හමු වී නැත. නිශ්ශංකමල්ල රජුගෙන් පසු පොළොන්නරු රාජධානියේ දේශපාලන තත්වය අවුල් සහගත විය. නිශ්ශංකමල්ල රජුගෙන් පසු පාලකයින් වාරිකර්මාන්ත ඉදි කිරීමට හෝ ප්‍රතිසංස්කරණය කිරීමට පෙලඹුණු ආකාරයක් දක්නට නොමැත. රජරට ශිෂ්ටාචාරයේ ජීවනාලිය වූයේ වාරිමාර්ග පද්ධතිය යි. එය නොසලකා හැරීම ද පොළොන්නරුව රාජධානිය බිඳ වැටීමට ඉවහල් විය. මෙවන් පසුබිමක් යටතේ සිදු වූ කාලිංග මාඝ ආක්‍රමණය පොළොන්නරු රාජධානිය බිඳ වැටීමට බලපෑ ආසන්න හේතුව ලෙස පිළිගත හැකි ය.

කාලිංග මාඝගේ මෙම ආක්‍රමණය රජරට ශිෂ්ටාචාරයේ වාරි මාර්ග පද්ධතිය විනාශ වීමට ඍජුවම බලපාන්නට විය. මාඝ ආක්‍රමණය පිළිබඳ මහාවංසයේ විස්තර වී තිබේ. වාරිමාර්ග පද්ධතිය විනාශ කිරීම, ආගමික ස්ථාන විනාශ කිරීම, පාලකයන් හා නිලධාරීන් ඝාතනය, පොත් පත් ගිනි තැබීම, සිංහලයන් සතු වස්තුව කේරල භටයන්ට ලබා දීම, භික්ෂූන් හා ප්‍රභූන් ඇතුළු ජනතාවට ශාරීරික හිංසා කිරීම ආදිය සිදු වූ බව එහි සඳහන් වේ. රජරට ශිෂ්ටාචාරයේ ජීවනාලිය වන් වූ වාරි මාර්ග පද්ධති විනාශ කරමින් වැව් අමුණු කඩා දමමින් ශිෂ්ටාචාරයේ මූලික ජල අවශ්‍යතාවය විනාශ කරන්නට විය. එමඟින් කෘෂිකර්මාන්තය බිඳ වැටී ජනයා ඉතාමත් දුෂ්කරතාවන්ට මුහුන දෙන්නට විය. මේ ආකාරයෙන් වර්ෂ 1215 දී කාලිංග මාඝ ආක්‍රමණය කර වැව් අමුණු වනසා පදනම විනාශ කිරීය. වාරි කර්මාන්තය එසේ අභාවයට ගොස් වසංගත රෝග පවා පැතිරිනි. මෙවන් ව්‍යාකූල තත්වයක් හමුවේ රජරට වාසින් රජරට ශිෂ්ටාචාරය අතැර දමා මේ වන විට පිබිදෙමින් පැවති නිරිත දිග ප්‍රදේශ වලට සංක්‍රමනය වීම සිදු වූ නිසාවෙන් සියවස් ගනනාවක් මුලුල්ලේ පැවති රජරට ශිෂ්ටාචාරයේ බිඳ වැටීම සිදු විය. එය යළිත් ගොඩ නැඟීමක කිසිදු සටහනක් නොවූ අතර මාඝ ආක්‍රමනයෙන් සිදු වූ හානිය නිසාවෙන් රජරට ආර්ථික තත්වය විශාල වශයෙන් ව්‍යාකූල වී රජරට ශිෂ්ටාචාරයේ අවසානය පොළොන්නරු යුගයේ අවසානයෙන් සිදු වූ බව අවසන් වශයෙන් පෙන්වා දිය හැක.

**නිගමනය**

පාලකයන් සියයකට අධික පිරිසක් රජකම් කළ රජරට ශිෂ්ටාචාරය ක්‍රමානුකූලව පරිහානියට පත්ව වීම අවසාන වශයෙන් මාඝ ආක්‍රමණයෙන් වැනසී ගොස් නිරිත දිග රාජධානි කරා විතැන් වීම සිදු විය. නිරිත දිග තෙත් කලාපයට අයත් වූ හෙයින් රජරට දී තරම් වාරි කර්මාන්තයේ අවශ්‍යතාවක් එහි නොවීය. ඒ නිසාවෙන් රජරට ආවේනික වූ වාරි තාක්ෂණික උරුමය, රජරට පරිහානියත් සමග අපෙන් ඈත්විය. එකිනෙක බැදී ඇති රජරට ශිෂ්ටාචාරය හා වාරි කර්මාන්තය අතර අන්තර් සබඳතාව බිඳී යාම තුල ශිෂ්ටාචාරය අවසන් විය. කෙසේ නමුත් මේ තුළින් පැහැදිලි වන්නේ රජරට ශිෂ්ටාචාරයේ දීර්ඝ පැවැත්ම තීරණය කරන ලද වාරි කර්මාන්ත වල අභාවය මුළු ශිෂ්ටාචාරයේ ම පරිහානියට ප්‍රධාන ලෙස බලපෑ බවයි.

**පරිශීලන**


ඉන්ද්‍රකීර්ති, සී. (2004), ***ශ්‍රී ලාංකේය ඉතිහාස තරංග,*** වරකාපොළ ආරිය ප්‍රකාශකයෝ.

බස්නායක, එච්. ටී. ***පුරාණ ශ්‍රී ලංකාවේ ජල ශිෂ්ටාචාරය***, සමන්ති පොත් ප්‍රකාශකයෝ

විතානාච්චි, සී. ආර්., (2005) ***ශ්‍රී ලංකාවේ අතීත වාරි උරුමය හා වාරි පුරාවිද්‍යා, පුරාතතන,*** ජාතික පුරාවිද්‍යා දින සමරු කලාපය, කොළඹ මධ්‍යම සංස්කෘතික අරමුදල, 95-100 පිටු.

විතානාච්චි, සී. ආර්., (2012) ***පුරාණ වාරි මාර්ග විකාශය හා පරාක්‍රම සමුද්‍රය, ශ්‍රී ලාංකේය ඉතිහාසය,*** වෙළුම සසල කොළඹ, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, 355-380 පිටු.

ක්‍රි. ව. 11 වන සියවසේ සිට ක්‍රි. ව. 15 වන සියවස දක්වා ඓතිහාසික තොරතුරු, 12 ශ්‍රේණිය ගුරු මාර්ගෝපදේශන සංග්‍රහය